# එකාදසමො පාඨො

## නාළිකෙරරුක්ඛො



නාළිකෙරො පන තාලවග්ගෙසු රුක්ඛෙසු එකො භවති. ලඞ්කාදීපෙ අයං රුක්ඛො අවිරලො. තථා'පි දීපස්ස මජ්ඣභාගෙ සීතාධිකත්තා එසො රුක්ඛො සම්මා න රුහති. වෙළාසන්නපදෙසෙසු මනුඤ්ඤං වඩ්ඪන්ති. නාළිකෙරරුක්ඛො උච්චතො දසරතනප්පමාණතො පට්ඨාය යාව පඤ්ඤාසරතනා වඩ්ඪති. අස්මිං රුක්ඛෙ පනස, ලබුජ රුක්ඛෙසු විය සාඛායො න සන්ති. තථාපි මොරපිඤ්ඡසදිසායො සාඛායො විජ්ජන්ති. කාලන්තරෙන පරිණතායො ඉමායො සාඛායො රුක්ඛතො මුඤ්චිත්වා පතන්ති. තෙන රුක්ඛස්ස න කොචි අන්තරායො. ලඞ්කාදීපිකා මනුස්සා ඉමාහි සාඛාහි අත්තනො ගෙහච්ඡදනං කරොන්ති. නාළිකෙරඵලස්මිං අන්තො මධුරං ජලං අත්ථි. තස්මා තරුණනාළිකෙරඵලානි අතිමධුරානි භවන්ති.

(පාළි රචනා 2)

පද මාලාව

**තාලවග්ගෙසු රුක්ඛෙසු** - තාලවර්ගයේ ගස් අතරෙහි
**අවිරලො** - විරල නොවේ. / දුලබ නැත
**වෙළාසන්න** - වෙරළබඩ
**සීතාධිකත්තා** - සීතළ අධික නිසා
**උච්චතො** - උසින්
**මනුඤ්ඤං** - හොඳින් / සිත්කළු ලෙස
**දසරතන** - දසරියන්
**පඤ්ඤාසරතන** - පනස් රියන්
**පනස** - කොස්
**ලබුජ** - දෙල්
**මොරපිඤ්ජ** - මොනරපිල්
**සදිස** - සමාන, වැනි, මෙන්
**විජ්ජන්ති** - විද්‍යාමාන වෙති
**පරිණත** - මුහුකුරා ගිය
**මුඤ්චිත්වා** - ගිලිහී
**ගෙහච්ඡදනං** - ගෙහි වහළ

**අභ්‍යාස**

**කස්මා** - කුමක් හෙයින් **කුහිං** - කොහි **කිත්තප්පමාණො** - කොපමණ
**කිං** - කුමක්

1. 'නාළිකෙරරුක්ඛා' ඡේදය සිංහලට නගන්න.
2. පහත දැක්වෙන ප්‍රශ්නවලට පාලියෙන් පිළිතුරු සපයන්න.

උදා: **නාළිකෙර රුක්ඛා කුත්‍ථ මනුඤ්ඤං වඩ්ඪන්ති?**
**නාළිකෙර රුක්ඛා වෙළාසන්නපදෙසෙසු මනුඤ්ඤං වඩ්ඪන්ති**

i. දීපස්ස මජ්ඣභාගෙ කස්මා නාළිකෙරරුක්ඛා සම්මා න රූහන්ති?
ii. නාළිකෙරරුක්ඛා කුහිං මනුඤ්ඤං රොහති?
iii. නාළිකෙරරුක්ඛා උච්චතො කිත්තප්පමාණො?
iv. මනුස්සා නාළිකෙරසාඛාහි කිං කරොන්ති?
v. කස්මා තරුණනාළිකෙරඵලානි අතිමධුරානි භවන්ති?

## අතීතකාල වාක්‍යය නිර්මාණය

වාක්‍යයක උක්ත වන පදයට වඩා ආඛ්‍යාතපදය වෙනස්වීම්වලට පත් වේ. එහි කාලභේදය, කාරකභේදය, පදභේදය යන ලක්ෂණ ද දක්නට ලැබේ. එහෙත් උක්තවත් නාමපදය කාලභේදය, කාරකභේදය හෝ පදභේදය නිසා වෙනස් නොවේ.

නිම කළ ක්‍රියාව අතීතකාලයෙන් ප්‍රකාශ වේ. ''මිගො ධාවි'' යන වාක්‍යයේ 'ධාවි' යන ආඛ්‍යාත පදයෙන් සිදු වූ ක්‍රියාර්ථයක් ප්‍රකාශ වේ. වාක්‍යයේ උක්තය වූ 'මිගො' යන පදය අයත් වන පඨමපුරිස හා ඒකවචන ලක්ෂණ ආඛ්‍යාතපදයේ ද එලෙස ම දක්නට ලැබේ 'ධාවි' යනු පඨමපුරිස ඒකවචන ආඛ්‍යාත පදයකි. කාලභේදය නාමපදයක දැකිය නොහැකි නිසා උක්තය වෙනස් නොවේ. පහත දැක්වෙන වගුව බලන්න.

| උක්තය | | | ආඛ්‍යාතය | | |
|---|---|---|---|---|---|
| පඨමපුරිස | ඒකවචන | සො | ගච්ඡි | ඒකවචන | පඨමපුරිස |
| | බහුවචන | තෙ | ගච්ඡිංසු | බහුවචන | |
| මජ්ඣිමපුරිස | ඒකවචන | ත්වං | ගච්ඡො | ඒකවචන | මජ්ඣිමපුරිස |
| | බහුවචන | තුම්හෙ | ගච්ඡිත්ථ | බහුවචන | |
| උත්තමපුරිස | ඒකවචන | අහං | ගච්ඡිං | ඒකවචන | උත්තමපුරිස |
| | බහුවචන | මයං | ගච්ඡිම්හා | බහුවචන | |

උදා:-

| | |
|---|---|
| සො අගච්ඡි. | තෙ අගච්ඡිංසු. |
| රාජා යුජ්ඣි. | රාජානො යුජ්ඣිංසු |
| ත්වං ගච්ඡො. | තුම්හෙ ගච්ඡිත්ථ |
| ත්වං බාදො. | තුම්හෙ බාදිත්ථ |
| අහං ගච්ඡිං. | මයං ගච්ඡිම්හ |
| අහං වන්දිං. | මයං වන්දිම්හා. |

## අනාගතකාල වාක්‍යය නිර්මාණය

සිදු නොකළ ක්‍රියාව අනාගත කාලයෙන් ප්‍රකාශ වේ. ''උපාසකො වන්දිස්සති'' යන වාක්‍යයේ 'වන්දිස්සති' යන ආඛ්‍යාත පදයෙන් මතුවට

සිදුවන ක්‍රියාවක් ප්‍රකාශ වේ. මෙම වාක්‍යයෙහි දී **උක්තපදය** හා **ආඛ්‍යාතපදය** පුරුෂභේදයෙන් හා වචනභේදයෙන් සමාන ව යෙදී තිබේ. එය පහත දැක්වෙන වගුව ආශ්‍රයෙන් හඳුනාගත හැකි ය.

| උක්තය | | | ආඛ්‍යාතය | | |
|---|---|---|---|---|---|
| **පඨමපුරිස** | එකවචන | **සො** | **ගච්ඡිස්සති** | එකවචන | **පඨමපුරිස** |
| | බහුවචන | **තෙ** | **ගච්ඡිස්සන්ති** | බහුවචන | |
| **මජ්ඣිමපුරිස** | එකවචන | **ත්වං** | **ගච්ඡිස්සසි** | එකවචන | **මජ්ඣිමපුරිස** |
| | බහුවචන | **තුම්හෙ** | **ගච්ඡිස්සථ** | බහුවචන | |
| **උත්තමපුරිස** | එකවචන | **අහං** | **ගච්ඡිස්සාමි** | එකවචන | **උත්තමපුරිස** |
| | බහුවචන | **මයං** | **ගච්ඡිස්සාම** | බහුවචන | |

උදා:-

සො ගච්ඡිස්සති. තෙ ගච්ඡිස්සන්ති.
රාජා යුජ්ඣිස්සති. රාජානො යුජ්ඣිස්සන්ති.

ත්වං ගච්ඡිස්සසි. තුම්හෙ ගච්ඡිස්සථ.
ත්වං ඛාදිස්සසි. තුම්හෙ ඛාදිස්සථ.

අහං ගච්ඡිස්සාමි. මයං ගච්ඡිස්සාම.
අහං වන්දිස්සාමි. මයං වන්දිස්සාම.

## කර්මපදයක් සහිත අතීතකාල හා අනාගතකාල වාක්‍යය නිර්මාණය

සරල අතීතකාල හෝ අනාගතකාල වාක්‍යයකට කර්මපදයක් යෙදූ විට කර්මපදයක් සහිත අතීතකාල හෝ අනාගතකාල වාක්‍යයක් සාදාගත හැකි ය.

### අතීතකාල වාක්‍යය

උපාසකො බුද්ධං වන්දි.
උපාසකා බුද්ධෙ වන්දිංසු.
භික්ඛු **රාජං** ඔවදි.
භික්ඛවො **රාජානො** ඔවදිංසු
අසප්පුරිසො **භික්ඛුං** ගරහි.
අසප්පුරිසා **භික්ඛවෙ** ගරහිංසු.

අනාගතකාල වාක්‍යය

උපාසකො බුද්ධං වන්දිස්සති.
උපාසකා බුද්ධෙ වන්දිස්සන්ති.
භික්ඛු රාජං ඔවදිස්සති.
භික්ඛවො රාජානො ඔවදිස්සන්ති.
අසප්පුරිසො **භික්ඛුං** ගරහිස්සති.
අසප්පුරිසා **භික්ඛවො** ගරහිස්සන්ති.

## අභ්‍යාස

1. පහත දැක්වෙන වර්තමානකාල ආඛ්‍යාතපදවල අතීතකාල හා අනාගතකාල ආඛ්‍යාතපද යොදා වගුව සම්පූර්ණ කරන්න.

| වර්තමානකාලය | අතීතකාලය | අනාගතකාලය |
|---|---|---|
| රොදති | | |
| තිට්ඨන්ති | | |
| ගච්ඡසි | | |
| නිසීදථ | | |
| වදති | | |
| ධාවථ | | |
| වන්දාමි | | |
| සුණාම | | |

2. පහත වාක්‍යය අතීත හා අනාගත කාලවලට හරවා ලියන්න.

i. දාරකො සයති.
ii. ත්වං රොදසි.
iii. තුම්හෙ නිසීදථ.
iv. සිස්සා සිප්පං උග්ගණ්හන්ති.
v. මාතා ඔදනං පචති.
vi. අහං බුද්ධං සරණං ගච්ඡාමි.
vii. මයං ධම්මං සුණාම.
viii. සොණා මනුස්සෙ භුඞ්කරොන්ති.
ix. ගජො වාපිං ඔරුහති.
x. මනුස්සා වනං පවිසන්ති.

3. ඉරි ඇඳි පද කෙරෙහි අවධානය යොමු කරමින් පහත වාක්‍යය නිවැරදි කර ලියන්න.

i. ලුද්දකෙ සරෙන මිගො විජ්ඣති.
ii. පුත්තා පාදෙහි කුක්කුරා පහරන්ති.
iii. බුද්ධෙන විහාරස්මිං සන්නිපතිතානං මනුස්සානං ධම්මස්ස දෙසෙති.
iv. කඤ්ඤාය ඝටානි උදකෙන පූරෙන්තා ගීතං ගායසි.
v. තුම්හෙ තථාගතස්ස සාවකෙහි නිමන්තෙත්වා දානං දෙම.
vi. අහං ආචරියො හොසි.
vii. අකුසලං පහාය නරානං සප්පුරිසා භවති.
viii. තුම්හෙසු සච්චං අධිගන්තුං ආරභථ.
ix. මයං පුඤ්ඤං ඉච්ඡන්තා සමණානං දානං දදාති.
x. බුද්ධෙ පසීදිත්වා උපාසකෙ දෙවපුත්තො හුත්වා සග්ගලොකෙ උපපජ්ජි.

4. පහත දැක්වෙන ආකාරයේ අයත් අතීතකාල වාක්‍යය ලියා දක්වන්න.

i. ප්‍රථමපුරුෂ ඒකවචන වාක්‍යය පහක් ලියන්න.
ii. එම වාක්‍යය බහුවචනයට හරවා ලියන්න.
iii. මධ්‍යමපුරුෂ ඒකවචන වාක්‍යය පහක් ලියන්න.
iv. එම වාක්‍යය බහුවචනයට හරවා ලියන්න.
v. උත්තමපුරුෂ ඒකවචන වාක්‍යය පහක් ලියන්න.
vi. එම වාක්‍යය බහුවචනයට හරවා ලියන්න.

5. එම වාක්‍යය අනාගතකාලයට හරවා ලියන්න.

**එකං අත්ථපදං සෙය්‍යො, යං සුත්වා උපසම්මති**

**සංසිඳීමට හේතුවන අර්ථවත් එක් පදයක් වුවද ඇසීම උතුම් ය.**

**(ධම්මපදපාළි, සහස්සවග්ග, 1 ගාථාව)**